අමාත්‍ය මණ්ඩලයේ සහ කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය.

55. (1) රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම මෙයින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුත්තේ ය.

(2) නීතියෙන් පිහිටුවන ලද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල කර්තව්‍ය හා බලතල කොමිෂන් සභා විසින් හීන කරනු නොලැබිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, සියලු දෙපාර්තමේන්තු ප්‍රධානයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම අමාත්‍ය මණ්ඩලය සතු වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් ඒ බලතල කොමිෂන් සභාවේ අදහස් විමසා දැනගැනීමෙන් පසුව ක්‍රියාවේ යෙදිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රජයේ නිලධරයන් හා සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කාරණා සඳහා විධිවිධාන සැලසීම ද ඒ කාරණා තීරණය කිරීම ද අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු අතර එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ ඒ ලිත් වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කමිටු.

56. (1) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ සාමාජිකයන් නොවන තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(3) එවැනි කමිටුවක රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ රැස්වීමක් සඳහා ගණපූරණය, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන රීති වලින් නිශ්චය කරනු ලබන පරිදි විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) ඒ එක් එක් කමිටුවකට ලේකම්වරයකු සිටිය යුතු අතර ඒ ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

රජයේ නිලධරයකු වෙත බලතල පැවරීම.

57. (1) කොමිෂන් සභාව විසින් නිශ්චිතව නියම කරන යම් ගණයක රජයේ නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසි හා කාර්ය පාටිපාටිවලට යටත්ව කොමිෂන් සභාව විසින් රාජ්‍ය නිලධරයකුට පවරා දෙනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් පවරා දීමක්, තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා කාර්ය පටිපාටි ද ඇතුළුව, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුත්තේ ය.

අභියාචනය කිරීමේ අයිතිවාසිකම.

58. (1) 56 වන ව්‍යවස්ථාව හෝ 57 වන ව්‍යවස්ථාව යටතේ, යම් කමිටුවක් හෝ නිලධරයකු හෝ විසින් තමා සම්බන්ධයෙන් කරන ලද උසස් කිරීමේ හෝ ස්ථාන මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ යම් නියමයකින් හෝ විනය කාරණයකට සම්බන්ධ වෙනත් යම් නියමයකින් අතෘප්තියට පත් යම් රජයේ නිලධරයකු විසින්, එම නියමයන්ට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට, අභියාචනයක් විභාග කිරීම සහ අභියාචනයක් තීරණය කිරීමට අදාළ වූ කාර්ය පටිපාටිය සහ අභියාචනයක් විභාග කර නිම කිරීමට නියමිත කාලය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව කොමිෂන් සභාව වෙත අභියාචනය කළ හැක්කේ ය.

(2) එවැනි අභියාචනයක් කරනු ලැබූ විට, ඒ අභියාචනය කර ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය සුදුසු යයි කොමිෂන් සභාවට පෙනී යන පරිදි වෙනස් කිරීමේ, මද වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන දීමේ හෝ වැඩිදුර හෝ වෙනත් පරීක්ෂණයක් පවත්වන ලෙස නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය.

59. (1) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයක් වන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට බලය ඇත්තේ ය.

(3) අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව ද ඇතුළුව ඒ විනිශ්චය අධිකාරවල සංයුතිය, බලතල සහ කාර්ය පටිපාටි සම්බන්ධයෙන් නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුත්තේ ය.

බලතල පවරා දී ඇති අවස්ථාවක කොමිෂන් සභාව ඒ බලතල ක්‍රියාවේ නොයෙදිය යුතු බව.

60. අවස්ථාවෝචිත පරිදි 56 වන ව්‍යවස්ථාව හෝ 57 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කමිටුවකට හෝ රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ යම් බලතල පවරා දෙනු ලැබූ විට, එසේ කොමිෂන් සභාවේ බලතල පවරා දීම වලංගුව පවතින තාක් කල්, ඒ බලතල පවරා දෙන ලද්දේ රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් සම්බන්ධයෙන් ද ඒ නිලධර ගණවලට අයත් නිලධරයන් සම්බන්ධව 58 වන ව්‍යවස්ථාවේ (1) වන හා (2) වන ඡේදවල විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ කර්තව්‍ය හෝ කාර්ය කිරීම හෝ ඉටු කිරීම නොකළ යුත්තේ ය.

රැස්වීම්වල කාර්ය පටිපාටිය.

61. (1) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු තීරණ අදාළ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේ ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී මූලසුන දරන සාමාජිකයාට තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. ඔහු පැමිණ නොමැති විටක, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරිය යුත්තේ ය.

නඩු කටයුතුවලින් මුක්තිය.

61අ. 126 වන ව්‍යවස්ථාවේ (1) වන, (2) වන, (3) වන, (4) වන සහ (5) වන ඡේදයන්හි විධිවිධානවලට යටත්ව කමිටුවක් විසින් හෝ යම් රජයේ නිලධරයකු විසින් මේ පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ ඒ කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ පැනවී ඇති, නැතහොත් කමිටුව වෙත හෝ රාජ්‍ය නිලධරයා වෙත පවරා දී ඇති යම් බලයක් හෝ කාර්යයක් ප්‍රකාර කරන ලද යම් නියමයක් හෝ තීරණයක් විභාග කිරීමට හෝ තීන්දුවක් දීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

බලාත්මකව පවතින රීති සහ නියෝග ඉතිරි කර තබා ගැනීම.

61ආ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, මේ පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි වූවාක් සේ අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බලාත්මකව පවතින ලෙස සැලකිය යුත්තේ ය.